# මගේ යාළු මාළුවා නැතිවුණ හැටි



කවිනි නිහින්සා මෙනන්

# මාගේ යාළු මාළුවා නැතිවුණ හැටි

**කවිනි නිහින්සා මෙනන්**

**2023 නොවැම්බර් 15**

**ISBN 978-624-206-600-4**

# පිදුම

මට හැමදාම ආදරය කරන

අම්මා, තාත්තා, අක්කා ඇතුළු පවුලේ

සැමටත්, මගේ සියලුම යහළුවන්ටත්,

මට ලස්සනට සිංහල අකුරු ලියන්න,

කියවන්න කියාදුන්

වාසනා ගුරු මෑණියන්ටත්,

මට ඉගැන්වූ සියලුම ගුරු මෑණිවරුන්ට සහ

පියවරුන්ටත් මගේ පළමු නිර්මාණය වන

**" මගේ යාළු මාළුවා නැතිවුණ හැටි"** කතාව

බැති සිතින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන, ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.


**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023.11.01

# මගේ යාළු මාළුවා නැතිවුණු හැටි

එක දවසක් දා මටයි, අක්කටයි, අම්මා ලස්සන තැඹිලි පාට මාළුවෙක් ගෙනත් දුන්නා. එයත් එක්කම අළු පාට මාළුවෙකුත් අපිට ලැබුණා. අපි එයාලට නම් දෙකකුත් දැම්මා.



තැඹිලි පාට මාළුවාගේ නම තමයි "සන්ෂයින්". අළු පාට මාළුවාගෙ නම "ලොලී."

ලොලී ටිකෙන් ටික නපුරු වෙන්න පටන් ගත්තා. ඊට පස්සේ එයා සන්ෂයින් පිටිපස්සෙන් පන්නන්න පටන් ගත්තා. දෙන්නා හැමදාම රණ්ඩු.

ලොලී සන්ෂයින්ගෙ වරල හපන්න පටන් ගත්තා. ටික දවසකින් සන්ෂයින්ගෙ ඇඟේ කළු තිත් මතු වෙන්න පටන් ගත්තා.

ඊට පස්සේ මම තාත්තාට කියලා සන්ෂයින්ට බෙහෙත් කුඩු ටිකක් වතුරට දැම්මා.

ඒත් බෙහෙත් කුඩු ටික කෑවේ ලොලී. ලොලී තවත් දඟ වැඩ කරන්න පටන් ගත්තා.

ටික දවසකින් සන්ෂයින් එක පැත්තකට හැරිලා හිටියා. ඒත් ලොලී එයාට කරදර කළා. සන්ෂයින්ගේ මූණ මැලවුණා.

ටික වෙලාවකින් සන්ෂයින් එහෙට මෙහෙට දැගලුවා.

ඊට පස්සේ එයා එක ඇසි පියක් ගැසුවා. මමයි, අක්කයි එයාට භයියෙන් කථා කළා. අනේ.... එයාට පණ නැතිව ගියා.

අපේ සන්ෂයින් මැරුණා.

ඊට පස්සේ තාත්තා යෝගට් කෝප්පයකින් සන්ෂයින් ව මාළුටැංකියෙන් අයින් කරලා වළකට දැම්මා.

මමයි,අක්කයි හොඳටම ඇඬුවා. ලොලී තනියෙන් එයාගෙ වැරැද්දට දුක්වෙවී මාළු ටැංකියේ හිටියා.

මට හිතුණා ලොලීට එයාගෙ වැරැද්ද තේරෙන්න ඇති කියලා.

මමයි, අක්කයි තේරුම්
ගත්තා රණ්ඩු නොවී හැමදාම
යාළුවෝ වගේ ඉන්න ඕනි
කියලා.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට
**සෙනෙවිරත්න මහලේකම්**
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ
ව්‍යාපෘතියේ නිර්මාපක
2023 11.01